ප්‍රජාතන්ත්‍රවාදයේ අර්බුදයයි.
ප්‍රජාතන්ත්‍රවාදය ගෙතිලා තියෙන්නේ වගවීම වටා. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය ක්‍රමයක් කියලා කියන්නේ ආධිපත්‍යයකින් තොරව, වගවීමකින් යුක්තව ක්‍රියාත්මක වන රාජ්‍ය ක්‍රමයක්. මේ වගවීමට මූලික වෙන්නේ නීතියේ ආධිපත්‍යය. නීතියේ ආධිපත්‍ය නැති තැනක වගවීම සිදුවෙන්නෙත් නැහැ. වගවීමෙන් මුක්තවීමට තියන ප්‍රධානතම හේතුවක් තමයි දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ ගැති දේශපාලනය. මේ නිසා අපිට යුක්තිය ලබාගැනීමට සිදුවන්නේ තෝරා-බේරා ගෙන. එතකොට සමාජයක් වශයෙනුත් හැමෝටම නීතිය ක්‍රියාත්මක විය යුතුයි නේද කියන අදහස අපි අතරින් ගිලිහෙනවා. අද දවසේ අපිට දකින්න ලැබෙන ලක්ෂණය තමයි හොඳ පුරවැසියන් පවා සිතනවා අපි කැමති සමහර අයට වගවීමෙන් මුක්තවීමක් තිබිය යුතුයි කියලා. අපි අකමැති, අපිට පිළිගන්න බැරි අයට තමයි නීතිය ක්‍රියාත්මක විය යුත්තේ කියලා. එවැනි දේශපාලනයක් බොහොම බරපතළ විදිහට මුල් බැසගත් ජනසමාජයක අපට එයින් පාලනය වන බවක් තමයි දැන් පෙනෙන්නට තියෙන්නේ. එය වෙනස් කිරීමේ මූලික පියවරක් වශයෙන් නව ව්‍යවස්ථාවක් සම්පාදනය සැළකිය හැකියි.

**අතුරු වාර්තාව මගින් අධිකරණ ක්‍රමයේ සිදු කිරීමට යෝජිත වෙනස්කම් පිළිබඳවද දැඩි විවේචනයක් එල්ල වෙනවා. මූලික අයිතිවාසිකම් නඩු විසඳීමට දැනට ශ්‍රේෂ්ඨාධිකරණය සතුව පවතින බලය පහළ අධිකරණවලටත් ලබාදීමට කෙරෙන යෝජනාව ඔබ දකින්නේ කොයි විදිහටද?**

ඔය දැඩි විවේචන එල්ල වෙන්නේ දේශපාලන බලයට පොර බදන යම් යම් අයගෙන්. මානව හිමිකම් කොමිසම විදිහට බැලුවත්, විශ්වවිද්‍යාල ආචාර්යවරියක් විදිහට බැලුවත්, පුරවැසියෙකු විදිහට බැලුවත් මට පෙනෙන්නේ ජනතාවට අවශ්‍ය බොහොම පහසුවෙන් අධිකරණයට ප්‍රවේශ වීමක්. ඒක අතිශයින්ම වැදගත්. අද තියන තත්ත්වය තමයි රටේ කොයි මුල්ලක සිටින පුරවැසියෙකුගේ වුවත් මූලික අයිතිවාසිකමක් කැඩුණු විට මාසයක් ඇතුළත උපරිමාධිකරණයට පැමිණ නඩුවක් පැවරිය යුතුයි. ඒකට විශාල මුදලකුත් වැය කළ යුතුයි. මේක සාමාන්‍ය පුරවැසියන් බොහෝ දෙනෙකුට ඉතා දුෂ්කර කාර්යයක්. අතුරු වාර්තාවේ යෝජනා වෙලා තියන ක්‍රමය තුළින් මූලිකව පළාත්බද අධිකරණ තුළින් ලබාගන්න පුළුවන් සහන තියනවා.

ඒ වගේම ඊට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණයට වුවත් අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. අද තියන ක්‍රමය අනුව මූලික අයිතිවාසිකම් නඩුවකදී ශ්‍රේෂ්ඨාධිකරණ පමණයි එකම තීරකයා. ශ්‍රේෂ්ඨාධිකරණය යම් කිසි මතයක ඉන්නවා නම් එතනින් එය අවසන් වෙනවා. ඉන් එහාට යනවා නම් යන්න තියෙන්නේ ජාත්‍යන්තර තලයට. රටේ සාමාන්‍ය පුරවැසියන්ට එවැනි පියවරයන්ට යෑම අතිශය දුෂ්කරයි. ඒ නිසා මම හිතන්නේ යෝජනා වෙලා තියන ක්‍රමය තුළ රටේ සාමාන්‍ය පුරවැසියන්ට තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම වෙනුවෙන් ඉදිරිපත් වෙන්න ලැබී තිබෙන අවස්ථාව දැනට පවතින අවස්ථාවට වඩා වැඩියි. මොකද වඩා පහසුවෙන් තමන් ජීවත්වන ප්‍රදේශයේ අධිකරණයකට යොමුවිය හැකි නිසා.

**ව්‍යවස්ථාව අර්ථ නිරූපනය සඳහා වෙනම අධිකරණයක් ඇති කිරීම?**

ඒක අතිශයින්ම වැදගත් යෝජනාවක්. අද දවසේ ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කරන්න පුළුවන් එකම අධිකරණය ශ්‍රේෂ්ඨාධිකරණය පමණයි. මේ අධිකරණය විසින් අපරාධ නඩු, සිවිල් නඩු මේ ඔක්කොම අහනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සම්බන්ධයෙන් අධිකරණයක් තියන කොට එය වෙනම අධිකරණයක් වෙනවා. ඒ වගේම එවැනි අධිකරණවල සාමාජිකත්වය සාමාන්‍ය අධිකරණයක සාමාජිකත්වයට වඩා වෙනස් වෙන්න පුළුවන්.
උදාහරණයක් විදිහට සම්ප්‍රදායික වශයෙන් අධිකරණ විනිශ්චයකාරයෙකු නොවන, එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු නීතිය පිළිබඳ විශාරදයෙකු වන පුද්ගලයෙකු වුණත් එවැනි අධිකරණයක සාමාජිකයෙක් විය හැකියි. එවැනි අවස්ථා ලෝකයේ තියනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, දේශපාලන ක්‍රමය, හොඳ සමාජ දැක්මක් තියන පරිණත පුද්ගලයන් අවශ්‍ය වෙනවා එවැනි අධිකරණයකට. නමුත් අද දවසේ වෙනත් බොහෝ නඩු එක්ක තමයි ශ්‍රේෂ්ඨාධිකරණය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නඩු අහන්නේ. එනිසා ඒ පිළිබඳ විශේෂඥ බවක් අද දවසේ අවශ්‍ය වන්නේ නෑ. නමුත් වෙනම ව්‍යවස්ථා අධිකරණයක් තියන කොට එතැන විශේෂඥ බවක් ඇතිවෙනවා.
උදාහරණයක් විදිහට ළමයින්ගේ නඩු අහන්න වෙනම අධිකරණයක් තිබීම දැක්විය හැකියි. මේක අතිශයින්ම වැදගත්. මොකද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ රටේ උත්තරීතර නීතිය. ඒ නිසා ඒ පිළිබඳ ඉතා ගැඹුරින් අධ්‍යයනය කරන, ඒ පිළිබඳ හසළ දැනුමක් තියන, සමාජය ගැන හොඳ දැනුමක් තියන පුද්ගලයන් පත්කරගැනීමට අවකාශ සැළසෙනවා. ඒ අයට සාම්ප්‍රදායික විනිශ්චයකාරවරයෙකු වීමේ අවශ්‍යතාවක් නැහැ. දේශපාලන අතපෙවීම් නැතිව මේ කටයුත්ත සිදු කළ හැකි වෙතොත් ඇත්තවශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ වඩාත් හොඳ අර්ථ නිරූපන ලබාගැනීමට අපිට හැකියාව ලැබෙනවා.

**පවතින අධිකරණ පද්ධතියෙන් බැහැරව එවැනි අධිකරණයක් පිහිටුවීම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ බලය පහලට වැටීමක් සිදු වෙන්නේ නැත්ද?**

නෑ. එවැනි දෙයක් වෙන්නේ නෑ. ශ්‍රේෂ්ඨාධිකරණයට තිබෙන බලය වෙනම විදිහේ බලයක්. වෙනත් සියලුම නඩු කටයුතු පිළිබඳ උපරිමාධිකරණය වෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු අධිකරණය කියන්නේ ඒ හා සමගාමීව යන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පමණක් කටයුතු කරන ඉහළම අධිකරණය. මම පුරවැසියෙක් හැටියට එය ඉල්ලා සිටිනවා. හේතුව අපි ඉල්ලා සිටින එක් දෙයක් තමයි අණ පනත් අධිකරණයේ අධීක්ෂණයට ලක් කළ යුතුයි කියන එක. 72 සහ 78 ව්‍යවස්ථා දෙකෙන්ම පාර්ලිමේන්තුවෙන් පණතක් පැනෙව්වාට පස්සේ කිසිම ආකාරයකින් අධිකරණයකටවත් ඒ පිළිබඳ ප්‍රශ්න කරන්න බෑ. ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවක්. මොකද රටේ පුරවැසියන්ට සහතිකයක් තියෙන්න ඕනේ රටේ හැම ආයතනයක්ම තමන්ට වගවෙනවා කියන්න. නීති සම්පාදන කටයුත්තේදීත් ඒ වගවීම තියෙන්න ඕනේ. ඒක සොයලා බලන්න පුළුවන් වෙන්නේ අධිකරණයට. එතකොට එවැනි අණ පනත්වල කෙටුම්පත් විතරක් නෙවෙයි පැනෙව්වාට පස්සෙත් අණ පනත් පරීක්ෂණයට ලක් කරලා ඒවා විභාග කරලා බලලා ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද කියා බලන්න විශේෂිත අධිකරණයක් තියන එක හොඳයි කියන එකයි මගේ මතය.

